" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone 011 - 2093000

ISO 9001 SLSI SYSTEM CERTIFIED

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

(13)

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-AP/03/FI/22

ඔබේ අංකය / உமது இலக்கம் / Your No.

දිනය / திகதி / Date 2021.12. 21

## මූල්‍ය චක්‍රලේඛ අංක 12/2021

බස්නාහිර පළාත් සභාවේ සියළුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) (බ.ප),
දෙපාර්තමේන්තු ප්‍රධානීන් (බ.ප),
බස්නාහිර පළාත් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**වාර්ෂික අක් මුදල් අයදුම් පත්‍රය - වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය 2022 වර්ෂය**

2022 වර්ෂයවෙනුවෙන් ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / කාර්යාලයට අනුමත කර ඇති ඇස්තමේන්තු හා පැවරී ඇති ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා වූ වාර්ෂික අක් මුදල් අයදුම් පත්‍රය හා වාර්ෂික අග්‍රිම ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි. ඉදිරි කාලයේ දී ලැබේ යැයි සනාථ කරන ලද ප්‍රතිපාදන මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අක්මුදල් අයදුම් පත්‍රය හා වාර්ෂික අග්‍රිම ප්‍රකාශනය සකස් කළ යුතු වේ.

02. ආකෘති පත්‍ර:-

I. වාර්ෂික අක් මුදල් අයදුම් පත්‍රය පිළියෙල කිරීම
(අ) ආකෘති පත්‍රය

II. වාර්ෂික අග්‍රිම ප්‍රකාශය පිළියෙල කිරීම
(ආ) ආකෘති පත්‍රය

03. අයදුම් පත්‍ර පිළියෙල කිරීමේදී පහත සඳහන් කරුණු වලට විශේෂ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

I. වෙනත් කාර්යාල වලින් ලැබෙන ප්‍රතිපාදන ද මෙයට ඇතුළත් විය යුතුය.

II. වෙනත් දෙපාර්තමේන්තු වලින් ලැබිය හැකි ප්‍රතිපාදන “ අ” ආකෘති පත්‍රයේ “3” තීරුවේ සඳහන් කළ යුතුය. එසේ සඳහන් කළ යුත්තේ එවැනි ප්‍රතිපාදන ලබා දෙන බවට අදාළ දෙපාර්තමේන්තුවෙන් තහවුරුවක් ලැබී ඇත්නම් පමණි.

III. “අ” ආකෘති පත්‍රයේ “8” තීරුව යටතේ දැක්විය යුත්තේ ඔබ කාර්යාලයට පළාත් භාණ්ඩාගාරයෙන් 2022 වර්ෂය සඳහා අවශ්‍ය වන අක්මුදල් ප්‍රමාණය වේ. මෙම මුදල් පළාත් භාණ්ඩාගාරය විසින් මුදාහරිනු ලබන්නේ මාසික පදනම යටතේ බැවින් එය ගණන් බලා ගත හැකි වන පරිදි මෙයට යා කර ඇති “ආ” ආකෘති පත්‍රය සම්පූර්ණ කර එවිය යුතුය.

IV. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා “අ” ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමේදී ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ශීර්ෂ අංක : 109 වැඩසටහන 03 ව්‍යාපෘතිය 02 යටතේ මෙතෙක් වෙන් කරන ලද ප්‍රතිපාදන “2” තීරුව යටතේ දැක්වීමටත්, පළාත් සභාවේ වෙනත් කාර්යාල වලින් ලැබී ඇති ප්‍රතිපාදන “3” තීරුවේ දැක්වීමටත් කටයුතු කළ යුතුවේ.

04. 2022 වර්ෂය සඳහා අක්මුදල් සීමාව නිකුත් කළ යුතු අග්‍රිමය තීරණය කිරීම සඳහා ඔබගේ අක්මුදල් අයදුම් පත්‍රය හා වාර්ෂික අග්‍රිම ප්‍රකාශනය **2021.12.27** දිනට ප්‍රථමගණකාධිකාරී,(පොත්තැබීම්), වෙත නොවරදවාම ඉදිරිපත් කළ යුතු බව සලකන්න. එදිනට මෙම වාර්තාව ඉදිරිපත් නොකරන කාර්යාල වෙනුවෙන් අක්මුදල් නිදහස් කිරීම, සීමා කිරීම හෝ මවිසින් තීරණය කරන අග්‍රිම මුදලක් නියම කිරීමට හෝ සිදුවන බවද මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි.

05. පළාත් භාණ්ඩාගාරය විසින් පළාත් මු.රී.44 පරිදි ඔබ ආයතනය වෙත අනුමත කරන ලද වාර්ෂික අග්‍රිම සීමාව පළාත් මු.රී.44.4 පරිදි පරිපූරක අග්‍රිම අධිකාරයක් ලබා ගෙන මිස එම සීමාව ඉක්මවා වියදම් කිරීම සඳහා අක්මුදල් ඉල්ලුම් නොකිරීමට කටයුතු කළ යුතුය.

06. පළාත් භාණ්ඩාගාරය විසින් මාසික අක්මුදල් නිකුත් කිරීමේදී වාර්ෂික අග්‍රිම සීමාව මෙන්ම පුද්ගල පඩිනඩි, පුනරාවර්තන, ප්‍රාග්ධන, සහ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් යන එක් එක් උප අග්‍රිම සීමාවන් ද සැලකිල්ලට ගනු ලබන බැවින් එම සීමාවන්ද නොඉක්මවන පරිදි අක්මුදල් ඉල්ලුම් කළ යුතුය.

07. කෙසේ වුවද මාස්පතා ඔබ කාර්යාලය විසින් ඉදිරිපත් කරනු ලබන පුරෝකථන වාර්තාව ඒ සඳහා නියමිත දින වල ඉදිරිපත් කළ යුතු බවද කාරුණිකව සලකන්න.

08. 2022ජනවාරි මස සිට අක් මුදල් නිදහස් කරනු ලබන්නේ අග්‍රිම සීමාව යටතේ බැවින් මේ සමග එවනු ලබන ආකෘති පත්‍ර පිළියෙළ කොට නියමිත දිනට පෙර පළාත් භාණ්ඩාගාරයේ පොත් තැබීම් අංශය වෙත එවීමට කටයුතු කළ යුතු අතර, එහි මෘදු පිටපතක් csofinbkkping2@gmail.comයන විද්‍යුත් ලිපිනයටද අනිවාර්යයෙන්ම යොමු කළ යුතුය. මේ සම්බන්ධව වැඩිදුර පැහැදිළි කිරීමක් අවශ්‍යවේ නම් ඒ සඳහා පළාත් භාණ්ඩාගාරයේ **0112092641** (ගණකාධිකාරී-පොත්තැබීම්) දරන අංකය හරහා සම්බන්ධ කරගන්නා ලෙස වැඩිදුරටත් දන්වමි.

ඒ.එම්.එස්.මල්කාන්ති,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) (වැ.බ),
ප්‍රධාන ලේකම්,පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

පිටපත:-
i. විගණකාධිපති,
ii. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
iii. අධ්‍යක්ෂ (ආදායම්)
iv. අධ්‍යක්ෂ (ගිණුම්භාගෙවීම්)

# 2022 වර්ෂය

"අ" ආකෘතිය

| ශීර්ෂය | වැඩසටහන 1 | ප්‍රතිපාදන | | එකතුව 4 | වෙනත් හරස් සටහන් ගෙවීම් 5 | වෙනත් දෙපාර්තමේන්තු වලට වෙන් කිරීම් 6 | එකතුව (5+6) 7 | පළාත් භාණ්ඩාගාර යෙන් අවශ්‍ය මුදල් (4-7) 8 | වෙනත් කරුණු 9 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්ෂික මුදල් ප්‍රකාශය (පරිපූරක ඇස්තමේන්තු සමග) 2 | වෙනත් දෙපාර්තමේන්තු වලින් ලැබී ඇති ප්‍රතිපාදන 3 | | | | | | |
| | 1.<br>2.<br>3. | | | | | | | | |
| වෙනත් ඉල්ලීම්<br>1. රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම<br>2. වාණිජ අත්තිකාරම් ගිණුම<br>3. තැන්පත් ගිණුම<br>එකතුව | | | | | | | | | |

ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.

.................................................................................................

අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා / ප්‍රාදේශීය ලේකම්

දිනය:

නිල මුද්‍රාව:

"ආ" ආකෘතියේ (8) තීරුවේ එකතුව අග්‍රිම මුදල

| ජනවාරි රු. | පෙබරවාරි රු. | මාර්තු රු. | අප්‍රේල් රු. | මැයි රු. | ජුනි රු. | ජූලි රු. | අගෝස්තු රු. | සැප්තැම්බර් රු. | ඔක්තෝබර් රු. | නොවැම්බර් රු. | දෙසැම්බර් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |

ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.

..........................................................................................

අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා / ප්‍රාදේශීය ලේකම්

දිනය:

නිල මුද්‍රාව:

" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01


මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/FIN-BK/06/FI/28 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. } දිනය / திகதி / Date } 2021.12.27

බස්නාහිර පළාත් සභාවේ සියළුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) (බ.ප),
දෙපාර්තමේන්තු ප්‍රධානීන් (බ.ප),
බස්නාහිර පළාත් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>වාර්ෂික අත් මුදල් අයදුම් පත්‍රය - වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය 2022 වර්ෂය</u>**

2022 වර්ෂය වෙනුවෙන් අත්මුදල් අයදුම් කිරීම සඳහා ඔබ වෙත ඉදිරිපත් කරණ ලද මූල්‍ය චක්‍රලේඛ 12/2021 හා බැඳේ.

02. ඉහත චක්‍රලේඛයේ **04** වන ඡේදය පහත පරිදි සංශෝධනය වන බව කාරුණිකව දන්වා සිටිමි.

" 2022 වර්ෂය සඳහා අත්මුදල් සීමාව නිකුත් කළ යුතු අග්‍රිමය තීරණය කිරීම සඳහා ඔබගේ අත්මුදල් අයදුම් පත්‍රය හා වාර්ෂික අග්‍රිම ප්‍රකාශනය **2022.01.07** දිනට ප්‍රථම ගණකාධිකාරී, (පොත්තැබීම්), වෙත නොවරදවාම ඉදිරිපත් කළ යුතු බව සලකන්න. එදිනට මෙම වාර්තාව ඉදිරිපත් නොකරන කාර්යාල වෙනුවෙන් අත්මුදල් නිදහස් කිරීම, සීමා කිරීම හෝ මවිසින් තීරණය කරන අග්‍රිම මුදලක් නියම කිරීමට හෝ සිදුවන බවද මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි."

03. මෙම සංශෝධනය මෙදින සිට ක්‍රියාත්මක වන අතර, මූල්‍ය චක්‍රලේඛ 12/2021 හි දැක්වෙන අනෙකුත් විධි විධානයන් ඒ අයුරින්ම බලපැවෙත්වෙන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ඒ.එම්.එස්.මල්කාන්ති,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) (වැ.බ),
ප්‍රධාන ලේකම්,පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

පිටපත :-
- i. විගණකාධිපති,
- ii. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
- iii. අධ්‍යක්ෂ (ආදායම්)
- iv. අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)